# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශේෂ

**අංක 14,936/4 — 1970 දෙසැම්බර් 17 වැනි බ්‍රහස්පතින්ද — 1970.12.17**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)**

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 16/54.

**සාප්පු හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත**

**40 වන වගන්තිය යටතේ වන වැයිංවේ ආඥාව**

1965 අංක 17 දරන නිවාඩු පනතේ 11 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1966 දෙසැම්බර් 22 වැනි දින අංක 14,726/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ නියෝගවලින් සංශෝධිත (129 වැනි අධිකාරය වන වන) සාප්පු හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 40 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ, එකී සාප්පු හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 42 වැනි වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ආඥාව.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

## ආඥාව

මේ ආඥාව මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රදේශයක් ඇතුළත පිහිටි සෑම සාප්පුවකටම අදළ විය යුතුය.

2. මේ ආඥාවේ 4 වැනි සහ 5 වැනි ඡේදවල ප්‍රකාශිතවම සලසා ඇති පරිදි හැර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි (3 වැනි ඡේදයේ විධිවිධාන අදලවන සාප්පුවක් හැර) සෑම සාප්පුවක්ම :—

(අ) සෑම කාලසීමාවකම පෝය දින හැර එක් එක් දිනයේ පෙ. ව. 8 දක්වා ද,

(ආ) සෑම කාලසීමාවකම පෝය දිනය හැර එක් එක් දිනයේ ප. ව. 9ට සහ ඊට පසුවද,

(ඇ) සෑම කාලසීමාවකම පෝය දිනය මුළුල්ලේමද,

බඩු මිළ දී ගන්නවුන්ට සේවය නොකිරීම සඳහා වසා තැබිය යුතුය.

3. මේ ආඥාවේ 5 වැනි ඡේදයේ ප්‍රකාශිතවම සලසා ඇති පරිදි හැර, මෙහි පහත නිශ්චිතව සඳහන් වන්නාවූද, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් ඇතුළත පිහිටියා වූද පහත සඳහන් වර්ගවලට අයත් සාප්පු :—

(අ) සෑම කාලසීමාවකම එක් එක් දිනයේ පෙ. ව. 8 දක්වා ද,

(ආ) සෑම කාලසීමාවකම එක් එක් දිනයේ ප. ව. 9ට සහ ඊට පසුවද,

බඩු මිළදී ගන්නවුන්ට සේවය නොකිරීම සඳහා වසා තැබිය යුතුය.

(i) මස් වෙළෙඳුන්ගේ කඩ,

(ii) අළුත් මාළු වෙළඳාම් කරන කඩ,

(iii) මල් කරුවන්ගේ සාප්පු,

(iv) අයිස් වෙළෙඳුන්ගේ සාප්පු,

(v) ඡායාරූප ශිල්පීන්ගේ සාප්පු,

(vi) පහත සඳහන් ද්‍රව්‍යයන්ගෙන් එනම්—

අළුත් පළතුරු, අළුත් එළවළු, බුලත්, විටට කන දුම්කොළ, පුවක්, තණකොළ, පිදුරු සහ පුනක්කු යන ද්‍රව්‍යයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් විකුණන සාප්පු.

(vii) දුම්කොළ වෙළඳුන්ගේ කඩ.

4. මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක පිහිටි යම් සාප්පුවක්, මෙම ආඥාවේ 2 වැනි ඡේදයෙහි සඳහන් විධිවිධානවලින් යම් කාලයක් තුළ ඒ සාප්පුව බඩු මිළදී ගන්නවුන්ට සේවය නොකිරීම පිණිස වසා තැබීමට නියමව තිබුණේවී නමුත්, කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව, ඒ ලියවිල්ලේ නිශ්චිතව සඳහන් කෙරෙන යම් කාලයක් තුළ බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණිස විවෘතව තැබිය හැකිය. එසේ වෙතත්, එම සාප්පුව සෑම කාලසීමාවකම එක් නියමිත දවසක් මුළුල්ලේම වසා තැබිය යුතුය.

938/7 — ජේ 19263 — 13,550 (70/12)

5. 2 වැනි හෝ 3 වැනි ඡෙදවල සඳහන් විධිවිධානවලින් හෝ මේ ආඥාවේ 4 වැනි ඡෙදය යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත ක ලැබූ යම් වැඩ පිළිවෙලක හෝ කුමක් සඳහන් වුවද,

(1) පහත සඳහන් එක් එක් දිනයට එනම්, නත්තල් දිනය, සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය, මුස්ලිම් වරුන්ගේ හජ්ජි උත්සව දි සිංහල මාස අනුව වෙසක් මාසයේ පුර පසළොස්වක් දිනයට පසුව එන දෙවන දිනය, හින්දු දීපාවලී උත්සව දිනය හා රාමසාන් උත් අවසානයේදී ලබන ඊළඟ දිනය වශයෙන් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් වර්ෂ 1965 අංක 17 දරන නිවාඩු ආඥාපනත ය නියම කළ දිනය, යන එක් එක් දිනයට පෙරාතුවම එන දින දහහතර මුළුල්ලේ—

බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම සඳහා මෙහි වූ උපලේඛනයේ සඳහන් යම් ප්‍රදේශයක පිහිටි යම් සාප්පුවක් සෑම කාල සීමා එක් එක් දිනයේ පෙ. ව. 8 සිට පස්වරු 9 වන තුරු නමුත් ඊට පසු නොව,

විවෘතව තැබිය හැකිය.

(2) කොළඹ කදිරවේලායුදසාමි කෝවිලේ හින්දු වෙල් රථ උත්සවයේ අන්තිම දිනයෙන් අවසන්වන දින හත තුළ කොළඹ මහ නගර පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් සාප්පුවක් බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණිස එවැනි එක් එක් දිනයේ පෙ. ව. 8 සිට මධ්‍ය රාත්‍රිය වනතුරු නමුත් ඊට පසු නොව,

විවෘතව තැබිය හැකිය.

(3) මහනුවර ඇසළ පෙරහැර පවත්වන අන්තිම දිනයෙන් අවසන් වන දින දහහතර තුළ, මහනුවර මහ නගර සභා පරිපාලන සීමා තුළ පි යම් සාප්පුවක්, බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණිස, එවැනි එක් එක් දිනයේ පෙ.ව. 8 සිට මධ්‍යම රාත්‍රිය වනතුරු, නමුත් ඊට නොව,

විවෘතව තැබිය හැකිය.

(4) සිංහල මාස අනුව වූ ඇසළ හා නිකිණි යන මාසවල පුර පසළොස්වක් දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයෙන් අවසන් වන දින හත මෙහි වූ උපලේඛනයේ (3) වැනි ඡෙදයේ විස්තර කර ඇති ප්‍රදේශය තුළ පිහිටි යම් සාප්පුවක් බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණි එවැනි එක් එක් දිනයේ පෙ.ව. 8 සිට මධ්‍යම රාත්‍රිය වන තුරු, නමුත් ඊට පසු නොව,

විවෘතව තැබිය හැකිය.

(5) සිංහල මාස අනුව වූ පොසොන් මස පුර පසළොස්වක් දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන දින හත තුළ, මෙ වූ උපලේඛනයේ 3 වැනි ඡෙදයේ විස්තර කර ඇති ප්‍රදේශය තුළ පිහිටි යම් සාප්පුවක් බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණිස, එවැ එක් එක් දිනයේ පෙ.ව. 8 සිට මධ්‍යම රාත්‍රිය වන තුරු, නමුත් ඊට පසු නොව,

විවෘතව තැබිය හැකිය.

(6) නල්ලූර් කන්දසාමි කෝවිලෙහි වාර්ෂික රථ උත්සවයේ අන්තිම දිනයෙන් අවසන් වන දින විසිහය තුළ යාපනයේ මහ නගර සභා සී ඇතුළත පිහිටි යම් සාප්පුවක් බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණිස එවැනි එක් එක් දිනයේ පෙ.ව. 8 සිට මධ්‍යම රාත්‍රිය වනතු නමුත්, ඊට පසු නොව,

විවෘතව තැබිය හැකිය.

(7) කොළඹ කොටුවේ පිහිටි යම් සාප්පුවක්, මගින් ගෙනයන නැවක් කොළඹ වරායේ නවත්වා තිබෙන යම් දවසක පෙ.ව. 8 සිට ප.ව. 11 ද තුරු නමුත් ඊට පසුව නොව, බඩු මිළදී ගන්නවුන්ට සේවය කිරීම පිණිස, ඒ සඳහා කම්කරු කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ල අවසර පත්‍රයක බලය යටතේ,

විවෘතව තැබිය හැකිය.

6. පහත සඳහන් වර්ගවලට අයත් සාප්පු මේ ආඥාවේ පෙරාතුව වූ විධිවිධානවලින් මෙයින් නිදහස් කරනු ලැබේ:—

(අ) භෝජන ශාලා, නේවාසික හෝටල, බත් කඩ, ආපන ශාලා හා තේ පැන් ශාලා ;
(ආ) පැට්‍රෝල් සේවා ස්ථාන ;
(ඇ) කිරිපට්ටි හා කිරිහල් ;
(ඈ) සිනමා ශාලා, නාට්‍ය ශාලා සහ වෙනත් එබඳු මහජන විනෝද ශාලා හෝ විනෝද ස්ථාන ;
(ඉ) ප්‍රවෘත්ති පත්‍ර සහ වෙනත් වාර සඟරා පමණක් විකුණන සාප්පු ;
(ඊ) දුම්රිය ස්ථානවල හෝ හෝටල්වල තිබෙන පොත් සාප්පු ;
(උ) බේකරි ;
(ඌ) නැව්වලට තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් බඩු සැපයීමේ ව්‍යාපාර කරගෙන යන සාප්පු ;
(එ) මත්පැන් විකුණන ස්ථාන ;
(ඒ) ඖෂධීය පැලෑටි විකුණන සාප්පු ;
(ඔ) පැට්‍රල් සහ තෙල් ගබඩා ස්ථාන සහ පැට්‍රල් සහ තෙල් ගබඩා.

7. මේ ආඥාවේ "කාල සීමාව" යන්නෙන් පද සම්බන්ධයෙන් අන් යමක් අදහස් කරනොත් හැර කිසියම් පෝය දිනයකට පෙර දි රාත්‍රියේ මැදියමත්, ඊළඟටම එළඹෙන පෝය දිනයට පෙර දින රාත්‍රියේ මැදියමත් අතරවූ කාල සීමාව අදහස් වෙයි.

8. වෙනයම් නීතියක විධිවිධාන බලපෑමෙන් මෙහි වූ උපලේඛනයෙහි සඳහන් වූ පාලන ප්‍රදේශවල සීමාවන්ගේ හෝ තත්ත්වයේ කුමන වෙනස සිදුවුවද, මේ ආඥාව ක්‍රියාත්මක විය යුතු අතර, මෙම උපලේඛනයේ විස්තර කරනු ලැබූ පාලන ප්‍රදේශ නිවැරදි අන්දමින් විස්තර වී ඇති ලෙස සැලකිය යුතු

9. (129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 40 වැනි වගන්තිය යටතේ සම්පාදන කරනු ලැබුවාවූ ද, 1967 මාර්තු 16 වැනි දින හා අංක 14,739/7 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද ආඥාව මෙයින් පරිච්ඡන්න කරනු ලැබේ.

## උපලේඛනය

1. බදුල්ල, කොළඹ, මඩකලපුව, දෙහිවල-ගල්කිස්ස, ගාල්ල, යාපනය, මහනුවර, කුරුණෑගල, මාතලේ, මීගමුව, නුවරඑළිය සහ රත්නපුර ය එක් එක් නාගරික සභා පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය.

2. අම්බලන්ගොඩ, අවිස්සාවේල්ල, බලන්ගොඩ, බණ්ඩාරවෙල, බේරුවල, චාවකච්චේරි, හලාවත, ගම්පහ, ගම්පල, හම්බන්තොට, හපුතලේ හැටන්-ඩික්ඔය, හොරණ, ජාඇල, කඩුගන්නාව, කළුතර, කෑගල්ල, කොලොන්නාව, කෝට්ටේ, කුලියාපිටිය, මාතර, මොරටුව, නාවලපිටිය, පානදු පැලියගොඩ, පේදුරුතුඩුව, පුත්තලම, තලවකැලේ-ලිඳුල, තංගල්ල, ත්‍රිකුණාමලය, වවුනියාව, වත්තල-මාබෝල, වත්තේගම සහ වැලිගම යන එක් එ පළාත් ආණ්ඩු සභා පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය.

3. උතුරෙන් හා ඊශාන දිශාවෙන් පුලියන්කුලමෙන් (අ.ග.පි. 164) සහ නල්ලපාම්බුකුලමෙන් (අ.ග.පි. 174) ද ; නැගෙනහිරෙන් පලයකුලමෙ (අ.ග.පි. 247) ; කුලන්කුලමෙන් (අ.ග.පි. 248) ; ඉච්චන්කුලමෙන් (අ.ග.පි. 255) සහ මහකලහ වැවෙන් (අ.ග.පි. 254) ද; දකුණෙන් සහ ගිණිකොණෙ කුඩා පල්ලාඩිකුලමෙන් (අ.ග.පි. 261) ; අට්ටිකුලමෙන් (අ.ග.පි. 260) සහ තම්මැන්නාකුලමෙන් (අ.ග.පි. 266) ද ; බස්නාහිරෙන්, නිරිතෙන් හා වයඹ මල්වතු ඔයෙන් ද සීමා කොට ඇති නුවරගම්පළාත (නැගෙනහිර හා බටහිර) ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ තුළ පිහිටියා වූ ප්‍රදේශය.

12–915

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි